# වැඩ බැරි දූස ගැන කතා

නිකොලායි නෝසව්

1



# කුසුම් පුරයේ වාමනයෝ



සී/ස ප්‍රෝග්‍රෙසිව් පබ්ලිෂිං හවුස් (පුද්.) සමාගම

## වැඩ බැරි දූස ගැන කතා

## නිකොලායි නෝසව් 1

# කුසුම් පුරයේ වාමනයෝ

අනුවාදය - දැදිගම වී. රුද්රිගු

**චිත්‍ර - බරීස් කලෞෂීන්**

නව පරිගණක සකැසුම - මාලක ලලනජීව

නව මුද්‍රණය 2017



**ප්‍රෝග්‍රෙසිව් පබ්ලිෂින් හවුස්**





එකමත් එක රටක රටක වාසය කළෝය, වාමනයෝ. ඒගොල්ලන්ට වාමනයන් කියලා කියන්නේ ඒගොල්ල බොහොම කුරු මිනිසුන් නිසා. ඒ රටේ මිනිසුන්ගේ උස කැකිරි ගෙඩියක් තරම් කියලා කියන්න පුළුවනි. පුරය බොහොම ලස්සනයි. හැම ගෙයක් වටේටම මල් පාත්ති. සමන් පිච්ච මල්, සෙව්වන්දි, දෑසමන්, ඩේසි නොයෙක් මල් වර්ග තිබුණා. පුරයේ මාවත්වල නම් පවා මල් වර්ග අනුව නම් කරලා. සෙව්වන්දි මහ මාවත, සමන් පටු මග, සේපාලිකා මග. පුරයේ නම කුසුම් පුරය. ගං ඉවුරක මේ පුරය පිහිටලා තිබුණා. වාමනයෝ මේ ගංගාවට කැකිරි ගඟ කියලා නම් කෙරුවා. මොකද දන්නවද, ගඟ දෙපැත්තෙ කැකිරි වැවිල තිබුණු නිසා.

ගඟෙන් එහා කැලෑව. බිරියෝසා ගස්වල පට්ටාවලින් හදාගත්තු ඔරුවලින් තමයි, මේ වාමනයෝ ගඟ තරණය කරලා කැලෑවට ගිහිල්ලා දන් වර්ග, පලු වර්ග, බිම්මල්, ඇට වර්ග එකතු කරන්නේ. දන් සහ පලු වර්ග එකතු කිරීම ලෙහෙසි නැහැ. කොට්ටන් ඇට හොයා ගැනීම බොහොම අමාරුයි. මේ වාමනයෝ බොහොම පුංචි මිනිසුන් නිසා ඒගොල්ලන්ට ලොකු පඳුරුවලට නැගලා අතු කියතෙන් කපන්න සිද්ද වුණා. බිම්මල් සහ හතු වර්ග පවා කියතෙන් කැපුවා. බිම්මලක් මුලින් කපලා, ඊට පස්සේ ඒවා කියතෙන් කෑලිවලට කපලා තමයි ගෙදර ගෙනියන්නේ.



පිරිමි වාමනයෝ දිග කලිසම්, කොට කලිසම් ඇඳලා හිටියා. ගෑනු වාමනියෝ ගවුම් ඇඳලා. ඒ ගවුම් ලස්සනයි, මල් වැටිලා. පිරිමි වාමනයෝ කොණ්ඩ කොටට හිටින්න කපලා. ගෑනු වාමනියෝ කොණ්ඩා දිගට වවලා. ඒ ගොල්ලන්ගේ කොණ්ඩා ලස්සන මෝස්තර අනුව පීරලා, දිගට හිටින්න ගොතලා, ලස්සන රිබන්, පීත්ත පටි, කොණ්ඩවලට බැඳලා තිබුණා. වාමන පිරිමි ළමයින්, වාමන ගෑනු ළමයින් සමග සමාගම් පවත්වන්ට ගියේ නැහැ. ඒ වගේම පුංචි ගෑනු ළමයින් පිරිමි ළමයින් සමග කතා කිරීමට ඉදිරිපත් වුණේ නැහැ. ඒ ගොල්ලා ආඩම්බර වුණා, ගෑනු ළමයින් නිසා. ඔන්න පිරිමි ළමයකුව දුර තියා දැක්කොත් ගෑනු ළමයෙක් ඉක්මණට පාරේ අනෙක් පැත්තට පැන ගන්නවා. ගෑනු ළමයින්ගේ හැසිරීම බොහොම නිවැරදියි. මොකද දන්නවද, පිරිමි ළමයෙක් ළඟින් ගියොත් ඒ පිරිමි ළමයා ගෑනු ළමයා අමනාප වන විදියට මොනවා හරි විහිළුවක් කරාවි, නැතිනම් තල්ලු කරාවි, ඒත් නැතිනම් එයාගෙ කෙස් වැටියෙන් අදීවි. පිරිමි කොල්ලෝ හරිම දඟකාරයෝ. සත්තකින් ම ඔක්කොම පිරිමි ළමයින් එක වගේ නරක නැහැ. නමුත් වේලාසනින් හොඳ කොල්ලා කවුද, නරක කොල්ලා කවුද යන්න දැන ගන්නේ කොහොමද? ඒගොල්ලන්ගේ නළලේ එහෙම ලියලා නැහැ නොවැ. අන්න එහෙම ලියලා තිබුණා නම්, නරක කොල්ලෙක් එන විට විතරක් පාරේ අනික් පැත්තට පැනලා බේරෙන්න පුළුවනි. වාමන කොල්ලෝ, වාමන කෙල්ලන්ව බොරු මනස්ගාතකාරියන් හැටියට හැඳින්වූවා. වාමන කෙල්ලෝ, වාමන කොල්ලන්ව සණ්ඩු කරන පොර කටුවන් ලෙස හැඳින්වූවා.



මේ පොත කියවන ළමයින්ට කියන්න පුළුවනි, මේ පොතේ එන කුසුම් පුරයත්, වාමනයිනුත් හිතෙන් මවා ගත්තු ඒවා කියලා. හැබෑ ජීවිතයේ මේ වාගේ වාමනයින් නැතැයි කියලා. හැබෑටම ජීවිතයේ වාමනයින් ඉන්නවයි කියලා අපි කියන්නේ නැහැ. හැබෑ ජීවිතය එකකි, අපේ කුසුම් පුරයේ ජීවිතය ඊට වඩා බොහෝ වෙනස්ය. අපේ මේ කුසුම් පුරයේ අපි කියන විදිහේ ළමයින් ඉන්නවා.

කුසුම් පුරේ සීනු මල් වීදියේ වාමන කොල්ලෝ දහසය දෙනෙක් හිටියා. ඒ ගොල්ලන්ගේ ලොක්කා තමයි, දක්ස පාල. එයාට දක්සයා කියන නම දාලා තිබුණේ එයා බොහෝ දේවල් දැනගෙන හිටිය නිසා. එයා බොහොම ගොඩාක් පොත් කියවලා තිබුණා. ඒ පොත් දක්ස පාලගේ මේසය, ඇඳ සහ පුටු උඩත්, ඒවා යටත් හැම තැනම තිබුණා. එයාගෙ කාමරයේ හැම තැනම පොත් දාලා තිබුණා. පොත් ගොඩක් කියවපු නිසා දක්ස පාල නුවණ ඇති ළමයෙක් වුණා. අනික් ළමයි එයාගෙ කතාවලට සවන් දෙන්න ආසයි. ඒ වගේ ම එයාට ආදරෙයි. එයා හැමදාම ඇන්දේ කළු පාට ඇඳුමක්. පොත් කියවන විට එයා ඇස් කණ්ණාඩි කුට්ටමක් දා ගන්නවා. එවිට එයාගෙ පෙනුම මහාචාර්ය කෙනෙකුගේ පෙනුමට සමානයි.





ඒ ගෙදර පුංචි දොස්තර කෙනෙක් හිටියා. වාමන ළමයින් ලෙඩ වුණාම ඒ ගොල්ලන්ට බෙහෙත් දෙන්නේ පුංචි දොස්තර. එයා හැමදාම සුදු ලෝගුවක් ඇඳලා සුදු තොප්පියක් හිසෙහි පැළඳලා හිටියා. යන්තර වැඩ දන්න ඉස්කුරුප්පු බාස් උන්නැහේ සහ එයාගෙ අත් උදව් කාරයා වන මුරිච්චියාත් පදිංචි වෙලා හිටියේ ඒ ගෙදර තමයි. මී පැණි දාසත් හිටියේ ඒ ගෙදරමයි. එයා බොහොම ආචාරශීලීයි. එයා බොහොම කැමතියි මී පැණියි, සෝඩා වතුරයි බීමට. ඒ ගෙදර තවත් පදිංචිකාරයෙක් තමයි, දඩයම් සේන. එයාට පුංචි බල්ලෙක් හිටියා. එයාගෙ නම බුල්කා. දඩයම් සේනට තුවක්කුවකුත් තියෙනවා. බෝතල පොරොප්ප දමලා වෙඩි තියන්න දඩයම් සේන ගජ හපනා. චිත්‍ර අඳින වර්ණ, සංගීත වාදක කුසල්, කඩිනම් රාළ, දොඩවන්නා, නිහඬයා, බොත්තමා, කලබලයා, ඒ වගේම 'අනේ-අපොයි' සහ බයනැත්තා කියන බෑයන් දෙදෙනාත් පදිංචි වෙලා හිටියේ මේ ගෙදරමයි. ඒ වුණාට මේ ළමයින් අතුරෙන් ඉතාම ප්‍රසිද්ධ ළමයා තමයි වැඩ බැරි දාස. එයාට කිසිම වැඩක් හරියට කරන්න බැරි හන්දා තමයි, එයා ඒ නමින් ප්‍රසිද්ධ වුණේ.



වැඩ බැරි දාස නිල් පාට තොප්පියක් හිස පළඳලා, කහ පාට කලිසමක් සහ රෝස පාට කමිසයක් ඇඳලා, කොළ පාට කර පටියක් බෙල්ල වටේට ඔතා ගන්නවා. එයා බොහොම කැමතියි තද පාටවලට. ගිරවකු වගේ ඇඳගෙන කුසුම් පුරේ හැමතැනම ගිහිල්ලා නොයෙක් කතා ගොතලා කියන්න උපන් පුතෙක් තමයි වැඩ බැරි දාස.





ඒ හැර එයා නිතර ගෑනු ළමයින්ව අමනාපයට පත් කළා. වැඩ බැරි දාසගේ රෝස පාට කමිසය දැකපු හැටියේ ම ගෑනු ළමයින්, හැංගෙන්නේ ඔය නිසයි. වැඩ බැරි දාසගේ මිතුරා තමයි ගුණෝ. එයා පදිංචි වෙලා හිටියේ පිච්ච මල් වීදියේ. මේ දෙදෙනා පල් හෑලි දොඩවන්ට ගප් හපන්නු. පැය ගණනක් වුණත් එක දිගටම කතා කරාවි. මේ දෙදෙනා දවසකට විසි පාරක් තරහ වෙලා විසි වරක් යාළු වෙනවා.

ඔන්න එක වැඩක් හින්දා වැඩ බැරි දාස ප්‍රසිද්ධ වුණා.

දවසක් දා වැඩ බැරි දාස නගරයේ ඇවිදලා, පිටියකට ඇවිත් තනි වුණා. අවට කිසිවෙක් නැහැ. කුරුමිණියෙක් ඉගිලිලා ඇවිත් වැඩ බැරි දාසගේ හිසට වේගයෙන් හැප්පුණා. වැඩ බැරි දාස තුන් කුන්දුන් ගැහිලා බිම පෙරළුණා.





ඒ වෙලාවේ කුරුමිණියා රූං ගාලා ඉගිලිලා ඈතට ගිය නිසා, වැඩ බැරි දාස උගව දැක්කේ නැහැ. එයා නැගිට වට පිට බැලුවා. කිසිවකු පේන්න හිටියේ නැහැ.

"මට ගැහුවේ කවුද? සමහර විට උඩ ඉඳලා මොනවා හරි වැටුණාද?" වැඩ බැරි දාස කල්පනා කළා.

උඩ බැලුවා. උඩත් කවුරුත් නැහැ. අහසේ හිරු විතරක් හොඳට බැබළෙනවා.

"එහෙනම් හිරුගෙන් තමයි, මගේ ඔළුවට මොනවා හරි වැටිලා තියෙන්නේ. හිරුගෙන් පුංචි කෑල්ලක් මගේ ඔළුවට වැටිලා තියෙනවා."

වැඩ බැරි දාස ගෙදර යන විට, එයාට වීදුරු බටයව හමු වුණා.

වීදුරු බටය ආකාශ වස්තු ගැන දන්නා කෙනෙක්. බෝතල කෑලිවලින් දුරදක්න, අනුදක්න, කණ්ණාඩි හදන්න වීදුරු බටේට පුළුවනි. අනු දක්නයෙන් බලන විට පුංචි දේ ලොකුවට පේනවා. දිග බටයකට ඔය වීදුරු කෑල්ලක් සවි කරලා එයා අහසේ තියෙන තරු, හඳ දිහා බැලුවා. වීදුරු බටය ආකාශ වස්තු විද්‍යාව ඉගෙන ගත්තේ ඔය ආකාරයටයි.



"වීදුරු බටේ, මේ අහන්නකො මට වෙච්ච සිද්ධියක්. ඉරෙන් කෑල්ලක් කැඩිලා මගේ ඔළුවට වැටුණා නෙව" වැඩ බැරි දාස කිව්වා.

"ඔයාට මක් වෙලාද? ඉරෙන් කෑල්ලක් කඩා වැටුණා නම් ඔයාව රොටියක් වගේ එහෙම පිටින්ම චප්ප වෙලා යාවි. ඉර මහ පොළොවට වඩා කීප වාරයක් විශාල බව ඔයා දන්නවද?" වීදුරු බටේ කිව්වා.

"ඒක වෙන්න බැරි වැඩක්. මට පෙනෙන හැටියට ඉර පිඟානකට වඩා ලොකු නැහැ"

"අපට එහෙම පෙනෙන්නේ ඉර අපට වඩා බොහොම ඈත තියෙන නිසා. ඉර මහා විශාල ගිනි බෝලයක්. මගේ දුරදක්න බටයෙන් මම දැකලා තියෙනවා. ඉරෙන් බොහොම පුංචි කෑල්ලක් කඩා වැටුණොත් අඩුම වශයෙන් මේ අපේ නගරය එහෙම පිටින්ම විනාශ වේවි."



"ඔය ඇත්තද? ඉර ඔය තරම් මහ විශාල බව මම දැනගෙන හිටියේ නැහැ. අපේ අනික් අය මේ ගැන දන්නේ නැති නිසා මම ඒ ගොල්ලන්ට ඉර ගැන කියන්නම්. කොහොම වුණත් ඔයා ආයෙමත් දුර දකින බටයෙන් ඉර දිහා බලන්න. සමහර විට ඉර මතු පිට කෑල්ලක් කැඩිච්ච හැටි දකින්න පුළුවන් වේවි," වැඩ බැරි දාස වීදුරු බටේට කියලා ගෙදර ගියා.

එයා ගෙදර යන ගමන් පාරේ යන එන අයට මේ ගැන කියන්න පටන් ගත්තා.

"ළමයිනේ ඔයගොල්ල දන්නවද, ඉර කොයි තරම් ලොකුද කියලා? අපේ මහ පොළොවටත් වැඩිය ලොකුයි. ඔන්න දැන් ඉරෙන් කෑල්ලක් කැඩිලා අපේ කුසුම් පුරය දෙසට පාත් වෙන්නයි එන්නේ. අපි ඔක්කොම යට වෙලා මහා විනාශයක් වේවි. ඔන්න, ඔය ගොල්ලන්ට ඔන් නම් වීදුරු බටයගෙන් අහන්න."



හැම දෙනාම හිනා වුණා. හැම දෙනාම දන්නවා වැඩ බැරි දාස වාචාලයෙක් බව. ඒ වුණාට එයා ගෙදර යන ගමන් කෑ ගහන්න පටන් ගත්තා.

"ළමයිනි, පණ බේරාගනිල්ලා, කෑල්ලක් පාත් වෙනවා!"

"මොන කෑල්ලක් ද?" ළමයි ඇහුවා.

"කෑල්ලක්! ඉරෙන් කෑල්ලක් කැඩිලා අපේ කුසුම් පුරයට වැටෙන්න එනවා. පණ බේරාගනිල්ලා! ඉර කොච්චර ලොකුද? ඉර මේ මහ පොළොවටත් වැඩිය ලොකුයි!"

"ඔය කතාව හිතෙන් මවා ගත්තා නේද?"

"අපොයි නැහැ. මට ඔය ගැන කියුවේ වීදුරු බටේ, එයා දුර දක්නයෙන් දැකලා තියෙනවා."

ඔක්කොමල්ලා මහ පාරට දුවලා ගිහිල්ලා ඉර දිහා බලන්න පටන් ගත්තා. ඇස්වලින් කඳුළු ගලන තුරු ඉර දිහා බැලුවා. ඇස්වල අන්ධකාරයක් ඇති වුණාම ඉරෙන් කෑල්ලක් අඩුයි වගේ පෙනෙන්නට වුණා. වැඩ බැරි දාස දිගටම කෑ ගහනවා.





"පුළුවන් අය පණ බේරාගනිල්ලා!"

එක් එක්කෙනා ඒ ගොල්ලන්ට අයිති දේවල් ගත්තා. වර්ණ පාට පෙට්ටි, පින්සල් ගත්තා. කුසල් එයාගෙ සංගීත භාණ්ඩ -වීණාව, බැලලයිකාව සහ තඹ නලාව ගත්තා. පුංචි දොස්තර ගමනට ගෙනියන බෙහෙත් පෙට්ටිය හොයන්න පටන් ගත්තා. ඒක කොහේදෝ දාලා. බොත්තමා රබර් සපත්තු කවරයි, කුඩෙයි අරගෙන දුවන්න පටන් ගත්තා. ඔන්න ඒ වෙලාවේ දී දක්ස පාල කෑ ගහලා මෙහෙම කිව්වා.

"ළමයිනි, සන්සුන් වෙයල්ලා! කිසිම භයානක දෙයක් වෙලා නැහැ. වැඩ බැරි දාස වාචාලයෙකු බව නුඹලා දන්නවා නේද? එයා මේවා සේරෝම හිතින් මවා ගෙන."

"මම හිතින් මවා ගත්තද? එහෙනම් නුඹලා වීදුරු බටේගෙන් අහපල්ලා"

එවර ඔක්කොමල්ලා වීදුරු බටයා හොයාගෙන ගිහිල්ල විස්තර විමසන්න වුණා. වැඩ බැරි දාස හිතින් හිතලා කියාපු බව හෙළි වුණා. ඒ වර ඔක්කෝමල්ලා හිනා වෙලා, වැඩ බැරි දාසට විහිළු කරන්න පටන් ගත්තා.





"අපි ඔයාට රැවටුණු හන්දා අපිම පුදුම වෙනවා"

"මගේ කතාව නුඹලා විතරක් නොවෙයි, මම පවා විශ්වාස කළා. ඒ නිසා මාත් පුදුම වෙනවා" කියලා වැඩ බැරි දාස කිව්වා.

වැඩ බැරි දාස ඔය වගේ ඔල්මාද කාරයෙක්.



වැඩ බැරි දාසගේ හපන්කම් ගැන තව දුරටත් ඔබ දැන ගැනීමට කැමති නම්, කුසුම් පුරයේ වැසියන් පිළිබඳ තොරතුරු ඔබට විවිධ කතා මගින් දැනගත හැකි ය. වැඩ බැරි දාස සංගීත කාරයෙක් වුණු හැටි, වැඩ බැරි දාස චිත්‍ර ශිල්පියෙක් වුණු හැටි.



සී/ස ප්‍රෝග්‍රෙසිව් පබ්ලිෂිං හවුස් (පුද්) සමාගම
91, ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මාවත, කොළඹ 08

ISBN 978-955-1319-56-4
9 789551 319564
LKR 200/-